# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1979 අංක 35 දරන අවිනිශ්චිත අවස්ථා අරමුදල පනත

---

[සහතිකය සටහන් කළේ 1979 මැයි මස 31 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1979 ජූනි මස 08 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක

මිල: ශත 45 යි

තැපැල් ගාස්තුව: ශත 25 යි

1979 අංක 35 දරන අවිනිශ්චිත අවස්ථා අරමුදල පනත

[සහතිකය සටහන් කළේ 1979 මැයි මස 31 වන දින]

එල්. ඩී.—ඕ. 5/79

**අවිනිශ්චිත අවස්ථා අරමුදලක් පිහිටුවීම පිණිස ද ඊට සම්බන්ධ හා ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

1972 මැයි මස 22 වන දින සම්මත කොට පනවන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 87(1) වන වගන්තිය අනුව ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 11 දරන පනතින් අවිනිශ්චිත අවස්ථා අරමුදලක් ඇති කරනු ලැබූ හෙයින් ද: පූර්විකාව.

1978 සැප්තැම්බර් මස 7 වන දින සිට බලපාන පරිදි ඉහත සඳහන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඉවත් කරනු ලැබූ හෙයින් ද:

1978 සැප්තැම්බර් මස 7 වන දින ක්‍රියාත්මක වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 151 (1) වන ව්‍යවස්ථාව අනුව, අවිනිශ්චිත අවස්ථා අරමුදලක් පිහිටුවීම සඳහා විධිවිධාන සලස්වනු ලැබූ හෙයින් ද:

ඉහත සඳහන් 151 (1) වන ව්‍යවස්ථාව අනුව අවිනිශ්චිත අවස්ථා අරමුදලක් ඇතිකිරීම සහ අවිනිශ්චිත අවස්ථා අරමුදලක් වශයෙන් 1978 සැප්තැම්බර් මස 7 වන දින සිට ක්‍රියාත්මක කරනු ලැබූ අරමුදලකට ගෙවනු ලැබුවා වූ ද ඒ අරමුදලින් ගෙවනු ලැබුවා වූ ද ඇතැම් ගෙවීම් වලංගු බවට පත්කිරීම දැන් අවශ්‍ය වී ඇති හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1979 අංක 35 දරන අවිනිශ්චිත අවස්ථා අරමුදල පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය 1978 සැප්තැම්බර් මස 7 වන දිනයේ දී ක්‍රියාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය. ලුහුඬු නාමය.

2. (1) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 151 (1) වන ව්‍යවස්ථාවේ සඳහන් අවස්ථාවල දී සහ ඒ ව්‍යවස්ථාවේ සඳහන් කරනු ලබන ආකාරයට පාවිච්චි කිරීම පිණිස (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) අවිනිශ්චිත අවස්ථා අරමුදලක් මෙයින් ඇති කරනු ලැබේ. අවිනිශ්චිත අවස්ථා අරමුදල.

(2) රුපියල් කෝටි හතරක මුදලක් ඒකාබද්ධ අරමුදලින් අරමුදලට ගෙවිය යුතු අතර, ඒ මුදල අරමුදලේ කොටසක් විය යුතු ය.

(3) අරමුදලට කරන ලද වෙන් කිරීම් වශයෙන් පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලබන ඒ සියලු මුදල් අරමුදලට බැර කළ යුතු ය.

ඒ 41405 — 11,750 (79/04)

ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 11 දරන පනතින් ඇති කරන ලද අවිනිශ්චිත අවස්ථා අරමුදලින් ගෙවන ලද අත්තිකාරම් මුදල්වලට අදාළ විධිවිධාන.

3. (1) ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 11 දරන අවිනිශ්චිත අවස්ථා අරමුදල් පනතින් ඇති කරන ලද අවිනිශ්චිත අවස්ථා අරමුදලින් 1978 සැප්තැම්බර් මස 7 වන දිනට පෙර ගෙවන ලද අත්තිකාරම් මුදලක් වන්නා වූ ද මේ පනත පනවන ලද දිනයේ දී ප්‍රතියෝජනය කරනු නොලැබුවා වූ ද මේ පනතේ පළමුවන උපලේඛනයෙහි සඳහන් සෑම මුදලක් ම, අරමුදලින් ගෙවනු ලැබූ අත්තිකාරම් මුදලක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ මුදල ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 151 වන ව්‍යවස්ථාවේ (3) වන අනුව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව ප්‍රතියෝජනය කරනු ලැබිය යුතු ය.

(2) ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 11 දරන අවිනිශ්චිත අවස්ථා අරමුදල් පනතින් ඇති කරන ලද අවිනිශ්චිත අවස්ථා අරමුදලින් 1978 සැප්තැම්බර් මස 7 වන දිනට පෙර ගෙවන ලද අත්තිකාරම් මුදලක් වන්නා වූ ද 1978 සැප්තැම්බර් මස 7 වන දිනයේ දී ආරම්භව මේ පනත පනවන ලද දිනයේ දී අවසන් වන කාලපරිච්ඡේදය තුළ දී අවිනිශ්චිත අවස්ථා අරමුදලක් වශයෙන් ක්‍රියාත්මක වූ අරමුදලට ප්‍රතියෝජනය කරනු ලැබුවා වූ ද මේ පනතේ දෙවන උපලේඛනයෙහි සඳහන් සෑම මුදලක් ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 151 වන ව්‍යවස්ථාවේ (3) වන අනුව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව අරමුදලින් ගෙවනු ලැබුවා වූ ද අරමුදලට ප්‍රතියෝජනය කරනු ලැබුවා වූ ද අත්තිකාරම් මුදලක් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

1978 සැප්තැම්බර් මස 7 වන දිනයේ දී ආරම්භව මේ පනත පනවන ලද දිනයේ දී අවසන් වන කාලපරිච්ඡේදය තුළ දී අවිනිශ්චිත අවස්ථා අරමුදලක් ලෙස ක්‍රියාත්මක කරනු ලැබූ අරමුදලින් ගෙවන ලද මුදල් වලට අදාළ විධිවිධාන.

4. (1) 1978 සැප්තැම්බර් මස 7 වන දිනයේ දී ආරම්භව මේ පනත පනවන ලද දිනයේ දී අවසන් වන කාලපරිච්ඡේදය තුළ අවිනිශ්චිත අවස්ථා අරමුදලක් වශයෙන් ක්‍රියාත්මක කරනු ලැබූ අරමුදලින් 1978 සැප්තැම්බර් මස 7 වන දිනට පසු ගෙවනු ලැබූ මුදලක් වන, මේ පනත පනවන ලද දිනයේ දී ඒ අරමුදලට ප්‍රතියෝජනය කර නොතිබුණා වූ ද මේ පනතේ තුන්වන උපලේඛනයෙහි සඳහන් සෑම මුදලක් ම අරමුදලින් ගෙවන ලද අත්තිකාරම් මුදලක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 151 වන ව්‍යවස්ථාවේ (3) වන අනුව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව ඒ මුදල අරමුදලට ප්‍රතියෝජනය කරනු ලැබිය යුතු ය.

(2) 1978 සැප්තැම්බර් මස 7 වන දිනයේ දී ආරම්භව මේ පනත පනවන ලද දිනයේ දී අවසන් වන කාලපරිච්ඡේදය තුළ අවිනිශ්චිත අවස්ථා අරමුදලක් වශයෙන් ක්‍රියාත්මක කරනු ලැබූ අරමුදලින් 1978 සැප්තැම්බර් මස 7 වන දිනයට පසු ගෙවනු ලැබූ මුදලක් වන්නා වූ ද ඒ අරමුදලට ප්‍රතියෝජනය කරනු ලැබුවා

වූ ද මේ පනතේ හතරවන උපලේඛනයෙහි සඳහන් සෑම මුදලක් ම, අරමුදලින් ගෙවනු ලැබුවා වූ ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 151 වන ව්‍යවස්ථාවේ (3) වන අනුව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව අරමුදලට ප්‍රතියෝජනය කරනු ලැබුවා වූ ද අත්තිකාරම් මුදලක් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

පළමුවන, දෙවන, තුන්වන සහ හතරවන උපලේඛනවල සඳහන් මුදල්වල සමස්ථය ඒකාබද්ධ අරමුදලින් අරමුදලට ගෙවන ලද මුදල වශයෙන් සලකනු ලැබිය යුතු බව.

5. මේ පනතේ පළමුවන, දෙවන, තුන්වන සහ හතරවන උපලේඛනවල සඳහන් මුදල්වල සමස්ථය, අරමුදලට ප්‍රතියෝජනය කරනු ලැබූ විට 2 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් රුපියල් කෝටි හතරක මුදලේ කොටසක් වශයෙන් ඒකාබද්ධ අරමුදලින් අරමුදලට ගෙවනු ලැබූ මුදල වශයෙන් සලකනු ලැබිය යුතු ය.

අරමුදලේ භාරකාරත්වය සහ ගිණුම්.

6. අරමුදලේ භාරකාරත්වය මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් දැරිය යුතු අතර ඊට අදාළ ගිණුම් ඔහු විසින් තැබිය යුතු ය:

එසේ වුව ද අරමුදලට අදාළ තමාගේ බලතල හා කාර්ය කිසිවක් ඒ ලේකම්වරයා විසින් යම් රජයේ නිලධරයකු වෙත පවරනු ලැබිය හැකි ය.

## පළමුවන උපලේඛනය

3(1) වන වගන්තිය

| | රු. |
|---|---|
| ජාතික මිල කොමිසම වෙත දෙන ලද අත්තිකාරම් මුදල ... | 3,00,000 |

## දෙවන උපලේඛනය

3(2) වන වගන්තිය

| | රු. |
|---|---|
| මහ කොළඹ ආර්ථික කොමිසම වෙත කරන ලද ප්‍රදානය ... | 1,00,00,000 |
| උසස් අධ්‍යාපනය පිළිබඳ අළුත් අමාත්‍යාංශය පිහිටුවීම ... | 5,50,000 |
| නීති කොමිසමේ වියදම ... ... | 3,15,000 |
| නියං සහනාධාර ... ... ... | 15,00,000 |
| කැනඩාවේ පවත්වන ලද අන්තර් ජාතික සංස්කෘතික උත්සවය | 1,00,000 |
| සුළි සුළඟින් විපතට පත්වූවන්ට සහනාධාර වශයෙන් ඉන්දියානු ආණ්ඩුවට දෙන ලද පරිත්‍යාගය ... ... | 10,00,000 |

4(1) වන වගන්තිය

## තුන්වන උපලේඛනය

| | රු. |
|---|---|
| පොල් කර්මාන්තය පිළිබඳ අළුත් අමාත්‍යාංශය පිහිටුවීම සඳහා අත්තිකාරම් මුදල ... ... ... | 1,00,000 |
| දිස්ත්‍රික් අමාත්‍යාංශ පිහිටුවීම සඳහා අත්තිකාරම් මුදල ... | 3,16,800 |
| ගම්පහ සහ පුත්තලමේ අළුත් කච්චේරි දෙකක් පිහිටුවීම සඳහා අත්තිකාරම් මුදල ... ... ... | 3,98,000 |
| කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපළට අත්‍යවශ්‍ය උපකරණ මිලට ගැනීම ... ... ... | 15,00,000 |
| 1977 ආසියානු අමාත්‍ය කණ්ඩායමේ ප්‍රාරම්භක රැස්වීම සඳහා අත්තිකාරම් මුදල ... ... ... | 11,00,000 |
| කටුනායක පිහිටි කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපළට තාක්ෂණික උපකරණ මිලට ගැනීම සඳහා අත්තිකාරම් මුදල ... | 15,00,000 |

4(2) වන වගන්තිය

## හතරවන උපලේඛනය

| | රු. |
|---|---|
| ගංවතුරින් විපතට පත්වූවන්ට සහනාධාර වශයෙන් ඉන්දියානු ආණ්ඩුවට කළ පරිත්‍යාගය ... ... | 10,00,000 |
| ජල සම්පත් මණ්ඩලයට දායක මුදල් ... | 10,00,000 |
| ග්‍රාම සංවර්ධනය පිළිබඳ අළුත් අමාත්‍යාංශය පිහිටුවීම සඳහා අත්තිකාරම් මුදල ... ..., ... | 5,00,000 |
| යෞවන කටයුතු හා සේවානියුක්තිය පිළිබඳ අළුත් අමාත්‍යාංශය පිහිටුවීම සඳහා අත්තිකාරම් මුදල ... ... | 5,00,000 |
| ග්‍රාමීය කර්මාන්ත සංවර්ධනය පිළිබඳ අළුත් අමාත්‍යාංශය පිහිටුවීම සඳහා අත්තිකාරම් මුදල ... ... | 5,00,000 |
| නව රාජ්‍ය අමාත්‍යාංශය පිහිටුවීම සඳහා අත්තිකාරම් මුදල ... | 5,00,000 |
| විදුලිබල සහ මහා මාර්ග පිළිබඳ අළුත් අමාත්‍යාංශය පිහිටුවීම සඳහා අත්තිකාරම් මුදල ... ... ... | 5,00,000 |
| මහවැලි සංවර්ධනය පිළිබඳ අළුත් අමාත්‍යාංශය පිහිටුවීම සඳහා අත්තිකාරම් මුදල ... ... ... | 5,00,000 |
| 1978 සුළි සුළං සහනාධාර ... ... | 1,00,00,000 |